සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................ **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I** කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. චීන සංවර්ධන ආකෘතිය සඳහා මාවෝ සේතුං යොදාගත් උදාන පාඨය වූයේ
    1. ගමින් ගමට සංවර්ධනය යන්නයි
    2. සහභාගිත්ව සංකල්පයයි
    3. පහළින් ඉහළට සංවර්ධනය යන්නයි
    4. ලුණු චරකය හා ස්වරාජ් යන්නයි
    5. මහජනයාගෙන් මහජනයාට යන්නයි

02. කිසියම් සිදුවීමකට අදාළව යම් පාර්ශවයක් වෙත නිසි තොරතුරු නොමැතිව තීරණ ගැනීමට යෑමේදී ඇතිවන ගැටුම් හඳුන්වනු ලබන්නේ,
    1. සාරධර්ම ගැටුම් ය
    2. ව්‍යුහමය ගැටුම් ය
    3. පුද්ගල සම්බන්ධතා ගැටුම්ය
    4. අවශ්‍යතා ගැටුම් ය
    5. තොරතුරු ගැටුම් ය

03. අන්තර් විෂයයිකව හා පාර විෂයයිකව විග්‍රහ කළ හැකි සංකල්පයකි.
    1. දැනුම් සමාජය
    2. ස්ව සංකල්පය
    3. ගෝලීයකරණ සංකල්පය
    4. නව ලිබරල් වාදය
    5. මාධ්‍ය සංස්කෘතිය

04. විශ්‍රාන්තිය ලෙස හැඳින්වෙන්නේ,
    1. කිසිදු වැඩක නිරත නොවී සැහැල්ලුවෙන් සිටීමයි
    2. වැඩ කරන කාලය අතරතුර ලබා ගන්නා විරාමයයි
    3. විවේකය ඵලදායි ලෙස ගත කිරීමයි
    4. සරල විනෝදයට හුරුවීමයි
    5. උසස් වින්දනය තුළින් ලබන මානසික සැහැල්ලුවයි

05. සංස්කෘතික සංවර්ධනයෙහි ලා විද්‍යාත්මක පදනමක් සහිත ව්‍යාපෘති ජාත්‍යන්තරව ක්‍රියාත්මක කරන ආයතන වන්නේ,
    1. ජාත්‍යන්තර ක්ෂමා ආයතනය
    2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
    3. ලෝක බැංකුව
    4. ලෝක සෞඛ්‍ය සංවිධානය
    5. යුනෙස්කෝ සංවිධානය

06. සාම්ප්‍රදායික සමාජ සංවර්ධනයෙහිලා සාම්ප්‍රදායික මාධ්‍ය වඩාත් වැදගත් වන්නේ, ඒවා
    1. ප්‍රායෝගික නමුත් සංකීර්ණ නොවන නිසාය
    2. හුරුපුරුදු සංඥා සංකේත හා සන්දර්භ වලින් යුක්ත වන නිසාය
    3. සැමවිටම සරල සුභාවිතයකින් යුක්ත වන නිසා ය
    4. වඩාත් නිර්මාණශීලී වන නිසාය
    5. ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය සහතික කරන නිසාය

07. මහාචාර්ය ජොහාන් ගැල්ටුන්ගේ ගැටුම් පිළිබඳ ත්‍රිකෝණයේ ප්‍රධාන අංග වන්නේ,
    1. ව්‍යුහය, ආකල්ප හා චර්යාවයි
    2. ආකල්ප, විසම්මුතිය හා චර්යාවයි
    3. දුරවබෝධය, ආකල්ප හා චර්යාවයි
    4. ව්‍යුහය, පාර්ශවකරුවන් හා ආකල්පයි
    5. පාර්ශවකරුවන්, විසම්මුතිය හා ආකල්පයි

08. ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල සුබවාදී සිදුවීම් ජාත්‍යන්තර ජනමාධ්‍ය වාර්තා කරනුයේ ඊට අඩු අවධානයක් යොමු කරමිනි. මෙවැනි තත්ත්වයක් වඩාත් හොඳින් පැහැදිලි කරගත හැක්කේ,

1. දෙපියවර සංකල්පයෙනි
2. සංවර්ධනාත්මක සංකල්පයෙනි
3. ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයෙනි
4. දොරටුපාල සංකල්පයෙනි
5. ගෝලීයකරණ සංකල්පයනි

09. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ ශිෂ්‍යයන් අතර ඇතිවූ සංවාදයක දී ඉදිරිපත් වූ අදහස් කිහිපයක් පහත දැක්වේ,

A වාණිජමය නිෂ්පාදනයක් බවය
B බොහෝ විට තාක්ෂණය හා බැඳී පවතින බවය
C පහසුවෙන් පරිභෝජනය කළ හැකි බව ය
D පූර්ණ කලාත්මක ස්වරූපයකින් යුක්ත බවය
E ගතික ලක්ෂණ වලින් සමන්විත බව ය

ඒ අතුරෙන් ජනප්‍රිය සංස්කෘතිය හා වඩාත් ගැලපෙන්නේ,

1. ABC හා D ය.
2. ABC හා E ය.
3. ABD හා E ය.
4. BCD හා E ය
5. ABCD හා E යන සියල්ලමය.

10. බරපතල රිය අනතුරකට භාජනය වූ කවිඳුට දීර්ඝකාලීනව රෝහල්ගත වී සිටින්නට සිදුවිය. මේ නිසා කවිඳුට ඇතිවිය හැකි සරල මානසික පීඩා තත්ත්වයක් වන්නේ,

1. වික්ෂිප්තාවයයි
2. ක්ලමතයයි
3. අතිශයෝක්තියයි
4. වෛරයයි
5. කාංසාවයි

11. වර්තමානයෙහි ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රවෘත්ති වාර්තාකරණයේ විෂමතා බෙහෙවින් දක්නට ලැබේ. ඒ අනුව ප්‍රවෘත්තියක නිරවද්‍යතාව රැඳී පවතින්නේ,

1. ප්‍රවෘත්ති සංස්කාරක සතු ප්‍රවෘත්ති තෝරා ගැනීමේ දක්ෂතාව පදනම් කරගෙනය
2. ප්‍රවෘත්ති සංස්කාරක සතු ඥාන ශක්තිය පදනම් කරගෙනය
3. ප්‍රවෘත්ති සංස්කාරකවරයාගේ සංස්කරණ හැකියාව පදනම් කරගෙනය
4. ප්‍රවෘත්ති වාර්තාකරු තෝරා ගන්නා මූලාශ්‍ර පදනම් කරගෙනය
5. ප්‍රවෘත්ති වාර්තාකරුවාගේ ලිවීමේ ශක්තිය පදනම් කරගෙනය

12. අප ජනමාධ්‍ය ක්‍රියාවලිය හා අනුගත වීමට නම්,

1. මාධ්‍ය අධ්‍යාපනය හොඳින් ලබාගත යුතුය
2. මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කරගත යුතුය
3. නූතන මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුවත් විය යුතුය
4. පුද්ගල න්‍යාය පත්‍ර මාධ්‍ය පාලනයට නතු නොවන ආකාරයට සකස් කරගත යුතුය
5. ඉහත කරුණු සියල්ල පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත යුතුය

13. සංවර්ධන සන්නිවේදන සුසමාදර්ශ සඳහා නිදසුනක් නොවන්නේ,

1. සර්වෝදය ව්‍යාපාරය
2. සමෘද්ධි ව්‍යාපාරය
3. සමුපකාර සමිති ව්‍යාපාරය
4. සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය
5. සණස ව්‍යාපාරය

14. ඕනෑම සමාජයක් ගොඩ නැගී ඇති ප්‍රධාන අංශ දෙක වන්නේ,

1. ආර්ථික අංශය හා දේශපාලනික අංශයයි
2. කාර්මික අංශය හා සේවා අංශයයි
3. ප්‍රජාමූල අංශය හා ව්‍යාපාර මූල්‍ය අංශයයි
4. ව්‍යාපාර මූල අංශය හා ආර්ථික මූල අංශයයි
5. ආර්ථික අංශය හා සමාජයීය අංශයයි

15. කැපකිරීම, දරා ගැනීම හා භාර ගැනීමට හුරු වූ මිනිසුන් වෙසෙන සමාජයක,

1 මාධ්‍ය සංස්කෘතියේ බලපෑම අවම වේ
2. ජනප්‍රිය සංස්කෘතියේ පැතිරීමට ඇති ඉඩකඩ සීමාවේ
3. සාමය හා සහජීවනය වර්ධනය වේ
4. විචිත්‍ර සංස්කෘතියක් පැතිරේ
5. මාධ්‍ය ප්‍රචණ්ඩත්වයට ඇති ඉඩකඩ අහිමි වේ

16. ජනප්‍රිය සංස්කෘතිය පිළිබඳ වඩාත්ම නිවැරැදි ප්‍රකාශය වන්නේ,

1. ජනප්‍රිය සංස්කෘතිය පහසුවෙන් පරිහරණය කළ නොහැක
2. ජනප්‍රිය සංස්කෘතියේ පැවැත්ම ඒකාකාරී ස්වභාවයක් ගනියි
3. තරුණ පිරිස ජනප්‍රිය සංස්කෘතියට ආකර්ෂණයක් නොදක්වයි
4. ජනප්‍රිය සංස්කෘතිය නිසා පාරිභෝගික ජනතාවට විවිධ ව්‍යසනකාරී තත්වයනට මුහුණ දීමට සිදුවේ
5. ජනප්‍රිය සංස්කෘතිය වාණිජමය නිෂ්පාදන හා බැඳී පවතින්නක් නොවේ

17. සන්නිවේදන විශාරදයන් පෙන්වා දෙන පරිදි සංවර්ධන සන්නිවේදනයේ දී මූලිකත්වය ලබාදිය යුත්තේ,
   1. ව්‍යාපෘතියටයි   2. ග්‍රාහකස්ථානයටයි   3. සැලසුමටයි
   4. උත්තේජනයටයි   5. අභිප්‍රේරණයටයි

18. චිත්‍ර ප්‍රදර්ශනයේ දී සිසුන් කිහිප දෙනෙක්ම එකම චිත්‍රයක් වෙත යොමුවී සිටින දැකගතහැකි විය. නමුත් ඒ එක් එක් අයගේ අවධානය යොමුවී තිබූ කාරණා විවිධ විය. මෙයට හේතුවිය හැක්කේ,
   1. චිත්තවේග වෙනස්කමය   2. පරිකල්පනයේ වෙනස්කමය
   3. බුද්ධි වර්ධනයේ වෙනස්කමය   4. සංජානනයෙ වෙනස්කමය
   5. විෂය දැනුම නොලැබීමය

19. පුද්ගල කුසලතා කිහිපයක් පහත දැක්වේ.
   A පරිහරණය කිරීමේ කුසලතාව   B විශ්ලේෂණය කිරීමේ කුසලතාව
   C ඇගයීමේ කුසලතාව   D නිර්මාණය කිරීමේ කුසලතාවය
   E තුලනාත්මක කුසලතාව
   මේවා අතුරෙන් මාධ්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ වන්නේ,
   1. ABC හා D ය   2. ABC හා E ය   3. ABD හා E ය
   4. BCD හා E ය   5. ABCD හා E යන සියල්ලමය

20. සන්නිවේදනය, සංජානනය, නියෝජනය ආදී කාර්යයන් දක්නට ලැබෙන්නේ,
   1. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය තුළය   2. ඥාන ගවේෂණය තුළය
   3. සමාජයීය සම්පත් හා බල කේන්ද්‍රණය තුළය   4. සමාජානුයෝජනය තුළය
   5. ගෝලීයකරණ සංකල්පය තුළය

21. මිනිසාගේ සැකය හා කුතුහලය ප්‍රයෝජනයට ගන්නා සන්නිවේදන විධි ක්‍රමය වන්නේ,
   1 වාචික සන්නිවේදනය   2. පුද්ගලාන්තර සන්නිවේදනය   3. ඕපාදූප දාමය
   4. අවිධිමත් සන්නිවේදනය   5. සම්භාවිතා දාමය

22. තාර්කික චින්තනය වර්ධනය පුළුල් වන්නේ පුද්ගලයාගේ,
   1. උපතේ සිටය   2. වයස අවුරුදු නවයේ පමණ සිටය.   3. තරුණ වියේ සිටය
   4. වැඩිහිටි අවධියේ සිටය   5. වෘද්ධ අවධියේ සිටය

23. ඉගෙනීම සම්බන්ධ නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
   1. දැනුම හෝ අත්දැකීම් ඔස්සේ සිදුවන චර්යාමය වෙනස්කමකි
   2. ඉගෙනගැනීමේ විවිධ රටා ඇත
   3. ඉගෙනීම අවිඥානිකව සිදුවන්නකි
   4. පරිසරය බලවත් ඉගෙනීම් සාධකයකි
   5. ඉගෙනීම සම්බන්ධ ප්‍රධාන න්‍යායන් දෙකක් ඇත

24. නායර් හා වයිට් හුවමාරු මාදිලියට අදාල සංකල්පයක් නොවන්නේ,
   1. පහළින් ඉහලට සංවර්ධනය   2. සහභාගීත්ව තීරණ ගැනීම
   3. ස්වදේශික දැනුම භාවිතය   4. බලය බෙදා ගැනීම
   5. ක්‍රියාවට පරිවර්තනය කිරීම

25. ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පරමාර්ථ අතරට අයත් නොවන්නේ,
   1. කුඩා කණ්ඩායම් නිර්මාණය තුළින් ග්‍රාමීය ජනතාව ශක්තිමත් කිරීම
   2. 2015 වන විට ආර්ථික භෞතික සංවර්ධනය
   3. දේශීය විදේශීය සංවිධාන සම්බන්ධීකරණය තුළින් පළාත්බද සංවර්ධනය
   4. සමස්ථ ප්‍රතිලාභ ග්‍රාමීය ප්‍රජාවට ලබා දෙමින් සංවර්ධනය
   5. කුඩා පරිමාණ මූල්‍ය ණය ජාලය ශක්තිමත් කිරීම

26. මාස්ලෝගේ අවශ්‍යතා පිරමීඩය තුළ දැකිය නොහැකි තත්ත්වයකි,
   1. ශාරීරික අවශ්‍යතා   2. ආරක්ෂණ අවශ්‍යතා
   3. පාරිසරික හා සමාජයීය අවශ්‍යතා   4. සමාජ පිළිගැනීම් අවශ්‍යතා
   5. ස්වාභිමානී අවශ්‍යතා

27. සරල මානසික පීඩා තුළින් ඇති විය හැකි අතුරු ප්‍රතිඵලයක් නොවන්නේ,
 1. වික්ෂිප්තතාව 2. වෛරය 3. ධ්‍රැවගතවීම
 4. අතිශයෝක්තිය 5. බලාපොරොත්තු රහිත වීම

28. 'සියලුම මිනිස් වර්ගයා එකිනෙකාට සහෝදරයන්ය' යන ප්‍රකාශය ඇත්තේ,
 1. කිතුනු ප්‍රවේශය තුළ ය 2. ඉස්ලාම් ප්‍රවේශය තුළ ය 3. බෞද්ධ ප්‍රවේශය තුළ ය
 4. හින්දු ප්‍රවේශය තුල ය 5. සෙන් බුදුදහමේ ප්‍රවේශය තුළ ය

29. සමථ මණ්ඩලය ස්ථාපිත වූයේ,
 1. 1995 අංක 30 දරණ පනත 2. 1980 අංක 28 දරණ පනත 3. 1988 අංක 71 දරන පනත
 4. 1988 අංක 72 දරන පනතින් 5. 1989 අංක 72 දරන පනත

30. තමා ජීවත්වන සමාජය වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම්,
 1. සමාජානුයෝජනය වේ 2. පුරවැසිභාවය හා මෙහෙවර වේ
 3. වගකීම හා වගවීම වේ 4. සංස්කෘතික ප්‍රගමනය හා හුවමාරුව වේ
 5. සමාජ උරුමය නව පරපුරට පවරාදීම වේ

31. ගැටුම් අවම සමාජයක පදනම වන්නේ,
 1. විවේකය, විනෝදය හා විශ්‍රාන්තියයි 2. කැප කිරීම, දරා ගැනීම හා භාරගැනීම පුහුණු කිරීමයි
 3. මාධ්‍ය සාක්ෂරතාව අත්පත් කරදීමයි 4. මාධ්‍ය අධ්‍යාපනය ලබාදීමයි
 5. සමාජානුයෝජනයයි

32. නිෂ්පාදන ක්‍රමය අනුව පංති ගැටුම් ඇතිවන බව විග්‍රහ වන්නේ සංවර්ධන සන්නිවේදනය පිළිබඳ,
 1. චීන අකෘතිය තුළය 2. නායර් හා වයිට් ආකෘතිය තුළ ය
 3. ලැසාස්ෆෙල්ඩ්ගේ දෙපියවර ආකෘතිය තුළ ය 4. මහත්මා ගාන්ධි ආකෘතිය තුළ ය
 5. ප්‍රජා මාධ්‍ය ආකෘතිය තුළ ය

33. රාජ්‍ය සංවර්ධන ක්‍රියාවලිය සංවිධාන ගත විය යුත්තේ,
 1. සංවර්ධන දර්ශකවලට අනුවය 2. රටවල් වර්ගීකරණයට අනුවය
 3. විදේශ ණය ආධාර මතය 4. පවත්නා තත්වය හා අනාගත ඉලක්ක වලට අදාළවය
 5. කාර්මීකරණයට අදාළවය

34. භාෂාව පිළිබඳ අසත්‍ය ප්‍රකාශයකි,
 1. භාෂාව කලාවක් මෙන් ම විද්‍යාවක් ද වේ
 2. විවිධ භාෂාවල හෝඩිය වෙනස්කම් සහිත ය
 3. භාෂාවේ ප්‍රභවය පිළිබඳ පරිණාමවාදී මතය නිවැරදි වේ
 4. අකුරේ හැඩය වෙනස්වීම නොනවතින ක්‍රියාවලියකි
 5. භාෂාවේ අර්ථවේදය හා සංඥාර්ථවේදය ඇත

35. සමාජ සම්බන්ධතා පිළිබඳ සමාජ පිළිගැනීම,
 1 සහානුභූතියයි 2. පුද්ගල පෞරුෂයයි 3. සමාජානුයෝජනයයි
 4. ස්ව - සංකල්පයයි 5. ආචාරශීලීත්වයයි

36. පුද්ගලයින් තුන් සියයක් පමණ අතුරුදහන් කරමින් ඊයේ රාත්‍රියේ සිදු වූ නාය යෑම පිළිබඳ පුවත අද පුවත්පත්වල ප්‍රමුඛ පුවත ලෙස වාර්තා වී තිබිණි. එය,
 1. ප්‍රවෘත්ති වාර්තාකරණයේ කාර්යක්ෂමභාවය පෙන්වන්නකි 2. කාලීන පුවත් වාර්තා කිරීමකි
 3. දෘඩ පුවත් වාර්තා කිරීමකි 4. මෘදු පුවත් වාර්තා කිරීමකි
 5. ගවේෂණාත්මක පුවත් වාර්තා කිරීමකි

37. පුද්ගලයාගේ හා පවුලේ අවශ්‍යතා සඳහා මුල්වන්නේ,
 1. ප්‍රජාමූල සංවිධානයි 2. ව්‍යාපාර මූල සංවිධානයි 3. වාත්තු නොකරන ලද සංවිධානයි
 4. කුල ක්‍රමයයි 5. වාත්තු කරන ලද සංවිධානයි

38. බිහිවීම අනුව නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
 1. ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත, අන්තර්ජාලය
 2. පුවත්පත, ගුවන් විදුලිය, රූපවාහිනිය, අන්තර්ජාලය
 3. රූපවාහිනිය, ගුවන්විදුලිය, පුවත්පත්, අන්තර්ජාලය
 4. පුවත්පත්, රූපවාහිනිය, ගුවන්විදුලිය, අන්තර්ජාලය
 5. පුවත්පත්, රූපවාහිනිය, අන්තර්ජාලය, ගුවන්විදුලිය

39. විශ්වීය මට්ටමේ තෝරාගැනීම් කෙරෙහි සියලුම රටවල ජනයා පොළඹවා ගැනීමට මුල් වී ඇත්තේ,
1. ජනප්‍රිය සංස්කෘතියයි
2. ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වයයි
3. ගෝලීයකරණ ක්‍රියාවලියයි
4. බහුජන සංස්කෘතියයි
5. දැනුම් සමාජයයි

40. වෙළඳ අපේක්ෂාවන් වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ,
1. සංස්කෘතික ආක්‍රමණය තුළය
2. සංස්කෘතික හුවමාරුව තුළය
3. සංස්කෘතික විසරණය තුළය
4. සංස්කෘතික රාශිකෘතිය තුළ ය
5. සංස්කෘතික සම්පර්කය තුළය

41. යැපීම් මානසිකත්වය බැහැර කිරීම,
1. නායර් හා වයිට් ආකෘතියේ ලක්ෂණයකි
2. මහත්මා ගාන්ධි දර්ශනයේ මූලික ලක්ෂණයකි
3. සංවර්ධන සන්නිවේදනයේ මූලික ලක්ෂණයකි
4. සංවර්ධනයේ මූලික ලක්ෂණයකි
5. ගෝලීයකරණයේ මූලික ලක්ෂණයකි

42. සංජානනය යන
1. ප්‍රබෝධක සඳහා ප්‍රතිචාර දැක්වීමයි
2. ස්මරණය කරගැනීමේ ක්‍රියාවලියයි
3. චින්තනය හා තේරුම්ගැනීමයි
4. යමක් අර්ථගැන්වීමයි
5. මනසින් සිතුවිලි මැවීමයි

43. ජනමාධ්‍ය විසින් ඉදිරිපත් කරන ශක්ති ජනක සංදේශයකට උදාහරණයක් වන්නේ,
1. මූල්‍ය ආයතනවලින් ණය ලබාගන්නා ආකාරය පෙන්වීමෙන් එදිනෙදාට අවශ්‍ය තොරතුරු ලබා දීම
2. ධර්ම දේශනා පැවැත්වීම මගින් ග්‍රාහකයාට උපදෙස් ලබාදීම
3. සංගීතමය වැඩසටහනකින් විනෝදාස්වාදය සැපයීම
4. නියෝගයක් දීම මගින් රෝගයකින් වැළැක්වීම
5. තදින් අවවාද කර වරදකින් මුදවාගැනීම

44. සවිඥානික බව හා විචාරශීලී චින්තනය සංවර්ධනයට වඩාත් උපකාරී වන්නේ,
1. මාධ්‍ය අධ්‍යාපනයයි
2. සමාජානුයෝජනයයි
3. අධ්‍යාපනයයි
4. ස්ව සංකල්පයයි
5. මාධ්‍ය සාක්ෂරතාවයි

45. බල කණ්ඩායම් දක්නට ලැබෙන්නේ,
1. සමාජ සංයුතිය තුළ ය
2. සාමාජික සම්පත් හා බල කේන්ද්‍රණය තුළය
3. උපරි ව්‍යුහය තුළ ය
4. අධෝ ව්‍යුහය තුළ ය
5 දේශපාලනය තුළය

46. මානව සමාජයේ අන්‍යෝන්‍යාත්තතාවයේ ප්‍රතිඵලයකි,
1. දැනුම් සමාජය
2. ජාත්‍යන්තර සබඳතා
3. ගෝලීයකරණය
4. සමාජයීය බලකේන්ද්‍රණය
5. නිර්බාධ වෙළඳාම

47. භාෂාවේ දෘශ්‍ය ස්වරූපය,
1. භාෂණයයි
2. රූපණයයි
3. කථනයයි
4. විවරණයයි
5. ලේඛනයයි

48. සන්නිවේදනයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ,
1. ජනමාධ්‍ය අතර තරගයේ පාලනය කිරීම
2. සමස්ථ සමාජයේ යහපැවැත්ම
3. සමාජ ප්‍රගමනය
4. ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධනය
5. ඉහත කිසිවක් නොවේ

49. දෙපාර්ශවයටම එකම භාෂාව අවශ්‍ය වන්නේ,
1. ශ්‍රව්‍ය සන්නිවේදනයේදී
2. දෘශ්‍ය සන්නිවේදනයේ දී
3. වාචික සන්නිවේදනයේදී
4. විධිමත් සන්නිවේදනයේදී
5. අවිධිමත් සන්නිවේදනයේ දී

50. පුද්ගලයෙකුගේ ප්‍රචණ්ඩත්වයෙන් අර්ථගැන්වෙන්නේ,
1. විශිෂ්ටත්වය හා ශක්තියයි
2. බල කේන්ද්‍රණයයි
3. කාය ශක්තිය හා මානසික ශක්තිය යි
4. මානසිකත්වයේ දුර්වලතාවයයි
5. සමාජනුයෝජනයක් නොමැති බවයි

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 29 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................. **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II** කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) ප්‍රචණ්ඩත්වය හා මාධ්‍ය ප්‍රචණ්ඩත්වය අර්ථ දක්වන්න. **(ලකුණු 2)**
(ii) මාධ්‍ය ප්‍රචණ්ඩත්වය තුළින් ගෘහස්ථ හා සාමාජීය පරිසරයට ඇතිවන බලපෑම් 4ක් දක්වන්න. **(ලකුණු 4)**
(iii) සාමාජීය සාමය හා සහජීවනය බිඳවැටීම් තුළින් දක්නට ලැබෙන අනිසි ප්‍රතිඵල 6ක් දක්වා, ඉන් 3ක් විස්තර කරන්න. **(ලකුණු 6)**
(iv) වර්තමාන තරුණ පරපුර හා බැඳී විලාසිතා සහ ඇඳුම් පැළඳුම් රටාවන් ද යම්තාක් දුරට සමාජය තුළ ගැටළුකාරී තත්ත්වයන් හා ගැටුම් ඇතිකිරීමට මුල්වී ඇති බව දක්නට ලැබේ. විමර්ෂණාත්මක විග්‍රහයක යෙදෙන්න. **(ලකුණු 8)**

02. (i) ජනප්‍රිය සංස්කෘතියේ අංග 8ක් දක්වන්න. **(ලකුණු 2)**
(ii) ජනප්‍රිය සංස්කෘතියේ පාර්ශවකරුවන් පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් දක්වන්න. **(ලකුණු 4)**
(iii) ජනප්‍රිය සංස්කෘතියේ සාමාජීය බලපෑම යහපත් කරුණු 3ක් සහ අයහපත් කරුණු 3ක් ඇසුරින් විස්තර කරන්න. **(ලකුණු 6)**
(iv) ජනප්‍රිය සංස්කෘතියේ බලපෑම තුළින් පාරිභෝගිකයාට සිදුවන අවපැවැත්ම හසුරුවා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

03. (i) සංස්කෘතිය පිළිබඳව බී මැලිනොව්ස්කි ගේ නිර්වචනය දක්වන්න. **(ලකුණු 2)**
(ii) පොලිස් මහජන සම්බන්ධතා කාර්යාංශයෙන් ඉටුවන සේවාවන් 4ක් දක්වන්න. **(ලකුණු 4)**
(iii) මිනිස් මොළයේ වම්පස සහ දකුණුපස ක්‍රියාකාරිත්වය පිළිබඳව සන්නිවේදන විද්‍යාත්මකව පැහැදිලි කරන්න. **(ලකුණු 6)**
(iv) ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය ජාතික සංවර්ධන ක්‍රියාවලිය සඳහා භාවිතය පිළිබඳව ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය ඇසුරින් විග්‍රහයක් කරන්න. **(ලකුණු 8)**

04. (i) මාධ්‍ය සාක්ෂරතාව පිළිබඳ යුරෝපා කොමිසමේ නිර්වචනය දක්වන්න. **(ලකුණු 2)**
(ii) මාධ්‍ය සාක්ෂරතාවයේ ප්‍රධාන සංකල්ප 4ක් දක්වා, ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**
(iii) ගෘහස්ථ සංස්කෘතිය කෙරෙහි විද්‍යුත් මාධ්‍යයේ බලපෑම උදාහරණ සහිතව විග්‍රහ කරන්න. **(ලකුණු 6)**
(iv) ඉගෙනුම් මෙවලමක් ලෙස ජනමාධ්‍ය සතුව විශාල ශක්තියක් ඇත. වර්තමාන සමාජය තුළ ඒ පිළිබඳ පවත්නා තත්ත්වය විමර්ෂණාත්මකව විග්‍රහ කරන්න. **(ලකුණු 8)**

05. (i) සාම ආකෘතිය දක්වන්න. **(ලකුණු 2)**
(ii) පුරවැසිභාවය හා මෙහෙවර අර්ථකථනය කරන්න. **(ලකුණු 4)**
(iii) කෙටි සටහන් ලියන්න.
1. කැපකිරීම, දරාගැනීම හා බාරගැනීම.
2. ජය ජය මාදිලිය
3. ගැටුමෙහි පාර්ශවකරුවන්. **(ලකුණු 6)**

(iv) සාමාජීය සාමය හා සහජීවනය පවත්වාගෙන යාම සඳහා පුරවැසියා සතු කාර්යභාරය වර්තමාන සමාජය ඇසුරින් විග්‍රහ කරන්න. **(ලකුණු 8)**

06. (i) දිගුකාලීන මානසික පීඩා තුළින් ඇතිවිය හැකි මානසික තත්ත්වයන් 4ක් නම් කරන්න. **(ලකුණු 2)**

(ii) පුද්ගලයාගේ මානසික සාමය බිඳවැටීම තුළ ප්‍රකට වියහැකි ලක්ෂණ 4ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

(iii) මානසික සාමය පිළිබඳ කිතුනු ප්‍රවේශය හා හින්දු ප්‍රවේශය පිළිබඳ විග්‍රහ කරන්න. **(ලකුණු 6)**

(iv) මානසික සාමය පිළිබඳ බෞද්ධ කතිකාවත වර්තමාන සමාජයට භාවිතා කළහැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

07. (i) සංවර්ධන සංදේශන ප්‍රවර්ධනයේදී සැලකිලිමත් වියයුතු කරුණු හතරක් දක්වන්න. **(ලකුණු 2)**

(ii) සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමේදී ඇතුළත් කළයුතු කරුණු 4ක් නම් කර එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

(iii) ''ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටකට ප්‍රජා මාධ්‍ය ආකෘතිය ඉතා වැදගත්ය' මෑත ඉතිහාසය ඇසුරින් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

(iv) දුෂ්කර ගම්මානයක් වෙත අන්තර්ජාල පහසුකම් සහ පරිඝණක පහසුකම් ලබාදීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක මහජන සම්බන්ධතා නිලධාරියා ලෙස ඔබ පත්කර ඇත. ව්‍යාපෘතිය පිළිබඳ ග්‍රාහක ජනතාව දැණුවත් කිරීම සඳහා යොදාගත හැකි සාම්ප්‍රදායික මාධ්‍ය සහ ඒවා භාවිතා කළහැකි ආකාරය පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. **(ලකුණු 8)**

## දෙවන වාර පරීක්ෂණය - 2019 - 13 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## Iකොටස

**පිළිතුරු පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 5 | **11.** - 4 | **21.** - 4 | **31.** - 2 | **41.** - 3 |
| **02.** - 5 | **12.** - 5 | **22.** - 2 | **32.** - 1 | **42.** - 4 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 3 | **33.** - 4 | **43.** - 3 |
| **04.** - 5 | **14.** - 3 | **24.** - 5 | **34.** - 3 | **44.** - 5 |
| **05.** - 5 | **15.** - 3 | **25.** - 4 | **35.** - 5 | **45.** - 1 |
| **06.** - 2 | **16.** - 4 | **26.** - 3 | **36.** - 3 | **46.** - 3 |
| **07.** - 1 | **17.** - 2 | **27.** - 5 | **37.** - 5 | **47.** - 5 |
| **08.** - 5 | **18.** - 4 | **28.** - 2 | **38.** - 2 | **48.** - 2 |
| **09.** - 2 | **19.** - 1 | **29.** - 4 | **39.** - 3 | **49.** - 3 |
| **10.** - 2 | **20.** - 2 | **30.** - 2 | **40.** - 1 | **50.** - 4 |

## II කොටස පිළිතුරු

01. (i) ''ස්වභාවික පරිසරයේ මානව හා භෞතික ඕනෑම දේකට හානි පැමිණවීම ප්‍රචණ්ඩත්වයයි. ''
''මාධ්‍ය මගින් මුදාහරිනු ලබන සංදේශ තුළ ප්‍රචණ්ඩත්වය අන්තර්ගතවීම මාධ්‍ය ප්‍රචණ්ඩත්වයයි.'' **(ලකුණු 2)**

(ii)
1. ගෘහය හා සමාජය තුළ ප්‍රචණ්ඩ පරිසරයක් නිර්මාණය වීම.
2. මාධ්‍ය ප්‍රචණ්ඩත්වය තුළින් සමාජය විසංවේදී බවට පත්වීම.
3. ගෘහස්ථ හා සාමාජීය ගැටුම් විසඳගැනීමට මාධ්‍ය මගින් අවස්ථාවක් ලබා නොදීම.
4. ප්‍රචණ්ඩකාරී පවුලක් තුළ ළමයාට යහපැවැත්මක් නොමැතිවීම. (නිවැරදි වෙනත් කරුණු ඇත්නම් අදාළ ලකුණු ලබාදෙන්න. **(ලකුණු 4)**

(iii)
1. ජනයා අතර විවිධත්වය ඉස්මතු වී විවිධ භේද නිර්මාණය වීම.
2. සමාජය බිඳවැටීමට උපකාරීකරන යටි අරමුණු සහිත පිරිස් බිහිවීම.
3. සාමාජීය සාමය හා සහජීවනයට එරෙහි විවිධ විනාශකාරී බලවේගබිහිවීම.
4. සමාජයේ සාමාන්‍ය පැවැත්ම දෙදරා යාම.
5. අරගලවලට එක්වූ සහ එක් නොවූ ජනයා සතු පොදු දේපළ හා මිනිස් ජීවිත විනාශවීම.
6. සමස්ථ දේශපාලන ක්‍රියාවලිය බිඳවැටීම. **(විෂය නිර්දේශයේ 09.04.02 කොටසට අදාළව පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබාදෙන්න.)** **(නම් කිරීමට = 1/2 x 6 = 3, විස්තර කිරීමට = 1x3 = 3මුළු ලකුණු 6)**

(iv) ප්‍රශ්නයට අදාළව විෂයට අදාළව කාලීන විග්‍රහයක යෙදී ඇත්නම් අදාළ ලකුණු ලබාදිය හැකිය.
**(ලකුණු 8) එකතුව 20**

02. (i) ආහාර පාන, ඇඳුම් පැළඳුම්, විලාසිතා, සංගීතය, යානවාහන, ගෘහ භාණ්ඩ, අධ්‍යාපනය, නිවාස අදහස්...
**(ලකුණු 2)**

(ii) ව්‍යාපාරිකයින්, බහුජන මාධ්‍ය, පාරිභෝගික ජනයා. **(ලකුණු 4)**

(iii) විෂය නිර්දේශයේ 10.03,05 කොටස ඇසුරින් පිළිතුරු සපයා ඇත්නම් ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 6)**

(iv) මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය අධ්‍යාපනය සමාජයකට අත්පත් කරදීම තුළින් ජනප්‍රිය සංස්කෘතියේ බලපෑම තුළින් පාරිභෝගිකයාට සිදුවන අවපැවැත්ම හසුරුවා ගැනීම .. ආදී වශයෙන් උදාහරණ සහිතව කරුණු දක්වා තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

03. (i) නිර්වචනය නිවැරදිව දක්වා තිබීම සහ නම සඳහන් කර තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 2)**

(ii)
1. අපරාධ නිවාරණ ක්‍රම පිළිබඳ ජනතාව දැණුවත් කිරීම.
2. පොලීසිය හා මහජනතාව අතර සබඳතාව වැඩිදියුණු කිරීම.
3. ජනතාව දැණුවත් කිරීම සඳහා වාර්තා හා කෙටි චිත්‍රපට ප්‍රදර්ශනය.
4. ආපදා අවස්ථාවලදී මහජනයාට පිළිසරණ වීම... ආදී වශයෙන් විෂය නිර්දේශයේ 05.01.04 ඇසුරින් දක්වා ඇති කරුණු සඳහාලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 4)**

(iii) විෂය නිර්දේශයේ 03.01,01 කොටසට අදාළ වගුව ඇසුරින් විග්‍රහ කර තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය.
**(ලකුණු 6)**

(iv) විෂය නිර්දේශයේ 02.02,02 කොටස සහ 07 වන ඒකකය ඇසුරින් පිළිතුරු ලබාදී ඇත්නම්ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

04. (i) මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍යයෙන් සෑම ආකාරයකින්ම ඉදිරිපත් කරන සංදේශ පරිහරණයකිරීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයුමට හා නිර්මාණය කිරීමට ලබාගන්නා හැකියාවයි. **(ලකුණු 2)**

(ii)
1. සංදේශ යනු ගොඩනංවන ලද්දකි. 2. මාධ්‍ය සංදේශ අර්ථ ගැන්වීම පුද්ගලයා මත රඳා පවතී.
3. මාධ්‍ය යනු ව්‍යාපාරික කර්මාන්තයකි.4. මාධ්‍ය විසින් සංදේශයන්හි මතවාද නතුකරගැනීම.

(නම් කිරීම සඳහා ලකුණු 1/2 x 4 = 2, කෙටි පැහැදිලි කිරීමට 2'' එකතුව **(ලකුණු 4)**

(iii) විෂය නිර්දේශයේ 10.02,02 ඒකකය ඇසුරින් උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් අදාළ ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 6)**

(iv) විෂය නිර්දේශයේ 10. 02.03 ඒකකය ඇසුරින් අදාළකරුණු ගළපා ඇතිනම් ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

ඇතුළත සාමය

05. (i)

**(ලකුණු 2)**

(ii) ''ඕනෑම පුද්ගලයෙකුට භූගෝලීය වශයෙන් වෙන්වූ සහ දේශපාලන ස්වාධීනත්වයක් සහිත ප්‍රදේශයක ජීවත්වීම සඳහා ඇති අයිතිය පුරවැසිභාවය වේ.''

''තමා ජීවත්වන සමාජය වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් පුරවැසියාගේ මෙහෙවර වේ.''

**(ලකුණු 4)**

(iii) 1. කැපකිරීම යනු යම් සමාජ සංසිද්ධීන් වලදී පොදු යහපත සඳහා තමන්ගේ පෞද්ගලික වාසි හෝ ලාභ ප්‍රයෝජන අත්හැරීමයි. දරාගැනීම යනු එවැනි පෞද්ගලික වාසියක්, ලාභ ප්‍රයෝජනයක් හෝ අවස්ථාවක් පොදු යහපත වෙනුවෙන් ඉවසා සිටීමයි. භාරගැනීම යනු ඒ ආකාරයෙන්ම වූ යම් සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස තමන්ට අත්පත්වන විසඳුමට එකඟවීමයි. **(ලකුණු 2)**

2.

| **1. වන පාර්ශවය** | **2 වන පාර්ශවය** |
|---|---|
| ජය | පරාජය |
| පරාජය | ජය |
| පරාජය | පරාජය |
| ජය | ජය |

**(ලකුණු 4)**

3. ගැටුමට ඍජුලෙසම සම්බන්ධවන ඍජු පාර්ශවකරුවන්, ගැටුම සමථයකට පත්කිරීමට ඉදිරිපත්වන මැදිහත්කරුවන් සහ ගැටුමේ වර්ධනයට වක්‍රව උදව් ලබාදෙන වක්‍ර පාර්ශවකරුවන් පිළිබඳ පැහැදිලි කර තිබීම. **(ලකුණු 6)**

(iv) ප්‍රශ්නයට අදාළව කාලීන නිග්‍රහයක යෙදී ඇත්නම් අදාළ ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

06. (i)
1. වික්ෂිප්තතාව
2. ආත්ම අනුකම්පාව
3. වෛරය
4. අනාරක්ෂිත හැඟීම
5. ධ්‍රැවගත වීම.
6. අතිශයෝක්තිය
7. හේතු යුක්ති දැක්වීම.
8. හැඟීම් යටපත්කර ගැනීම.

**(ලකුණු 2)**

(ii)
1. අපිළිවෙල
2. ගතිපැවතුම් අවුල් වීම.
3. සමාජගත නොවීම.
4. සතුටක් නොමැතිවීම.....

ඒකකයට අදාළව කරුණු 4ක් නම් කිරිම සහ පැහැදිලි කිරීම සඳහා ලකුණු ලබාදිය හැකිය.

**(නම් කිරීම සඳහා 1/2 x 4 = 2,පැහැදිලි කිරීමට 2 එකතුව 4)**

(iii) 09.02.05 ඒකකය ඇසුරින් පිළිතුරු සපයා තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 6)**

(iv) පිළිතුරෙහි අදාළබව සලකා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

07. (i)
1. සංවර්ධන සංදේශ නිර්මානය කිරීමට පෙර සිටම එහි ප්‍රවර්ධන සැලැස්ම සකස් කර තිබීම.
2. නිසි සැලැස්මක් හා කාල රාමුවක් සහිතව කළයුතු බව.
3. ප්‍රවර්ධන සැලැස්ම තුළ වෙනස්කම් ඇතුල්කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබීම.
4. නිසි කාල රාමුවක් සහිතව ක්‍රියාත්මක වීම ... ආදී වශයෙන් විෂය නිර්දේශයේ 07.02.04 කොටසට අදාළ කරුණුවලින් 04ක් දක්වා තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 2)**

(ii)
1. ඉලක්ක හා අරමුණු
2. කාර්යය පථය හා සීමා
3. පාර්ශවකරුවන් හා සංවිධාන ව්‍යුහය
4. ක්‍රම - විධි හා උපාය මාර්ග.......විෂය නිර්දශයේ 08.02 කොටස ඇසුරින් කරුණු 4ක් දක්වා ඇත්නම් ලකුණු ලබාදිය හැක. **(නම් කිරීමට 1/2 x 4 = 2, කෙටි පැහැදිලි කිරීමට 2 = එකතුව 4)**

(iii) ප්‍රජා මාධ්‍ය ආකෘතිය, එහි ඉතිහාසය සහ ශ්‍රී ලංකාවේ භාවිතය ඇසුරින් විස්තර කර තිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 6)**

(iv) සංවර්ධන සන්නිවේදනය සඳහා සාම්ප්‍රදායික මාධ්‍ය භාවිතය සහ මහජන සම්බන්ධතා නිපුණතා යන ඒකක ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කිරීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

**අවසාන ලකුණු = 100**

**සැ.යු: I හා II කොටස් සඳහා දීර්ඝ පැහැදිලි කිරීම් අවශ්‍ය නැත. කෙටි පිළිතුරු ප්‍රමාණවත් ය.**